විෂය - නර්තනය

13 ශ්‍රේණිය

සැකසීම: එම්.පී.ඩබ්.ආර්.මුතුගල
ර/ ගන්කන්ද මධ්‍ය විද්‍යාලය

## I වාරය

නිපුණතාව - 2.0 නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම - 2.1 රංග වින්‍යාසය පිළිබඳ අධ්‍යනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම - 2.1 රංග වින්‍යාසයේ දී සිරුර හැසිරවීම අවකාශය භාවිතය පිළිබඳ තොරතුරු විමසමු.

ඉගෙනුම් ඵල -

- රංග වින්‍යාසය හා සැබඳි මූලික සංකල්ප විස්තර කරයි.
- චලනයෙහි ස්වභාවය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.
- නර්තනයේ දී හා චරිත නිරූපනයේ දී අංග, ප්‍රත්‍යංග, උපාංග භාවිතා වන අකාරය අධ්‍යනය කොට කරුණු ඉදිරිපත් කරයි.
- රංග වින්‍යාසය හා අවකාශය භාවිතය අතර අන්‍යෝන්‍ය සබඳතාව විග්‍රහ කරයි.
- සම්බන්ධතා සංකල්පය රංග වින්‍යාසයේ දී යෙදෙන ආකාරය විමර්ශනය කර කරුණු දක්වයි.
- නර්තනය හා චරිත නිරූපනය ප්‍රදර්ශනය කිරීමේ දී චලන හසුරවමින් අවකාශය භාවිතා කිරීමේ වැදගත්කම විස්තර කරයි.
- නව නළු රස නිරූපනය කරයි.

ශිෂ්‍යා කළයුතු කාර්යයන් -

- රංග වින්‍යාසය හා සම්බන්ධ දෘශ්‍ය පට එක්රැස් කරන්න.
- රංග වින්‍යාසය ප්‍රමිතිගතව සිදුකෙරුණු නර්තන අංග එක්රැස් කරන්න.

ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක -

- 13 ශ්‍රේණිය නර්තන අතිරේක කියවීම් පොත
- කොහොඹා යක්කම් කාරිය සහ සමාජය - මුදියන්සේ දිසානායක
- **You Tube** නාලිකාව

ඇගයීම් -

- රංග වින්‍යාසය හා සබැඳි මූලික සංකල්ප විස්තර කරන්න.
- චලනයෙහි ස්වභාවය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක දෙකක් උදාහරණ දක්වමින් විස්තර කරන්න.

පහත ඇගයීම් ද සිදුකරන්න.-

- සති පාසල් කාර්ය පත්‍රිකාව අංක 08 ස්වයං අධ්‍යාපනයට යොමුවන්න.

පසු ක්‍රියාකාරකම් -

- විධිමත් රංග වින්‍යාසයකින් යුක්ත නර්තන අංගයක් තම පන්තියේ සිසුන් සහභාගී කොටගෙන නිර්මාණය කරන්න.
- රංග වින්‍යාසය විධිමත්ව පවත්වමින් නර්තන අංග ඇතුළත් දෘශ්‍ය පට ගොනුවක් සකස් කරන්න.